133501

AL/2022(2023)/12/S

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

**සාමාන්‍ය පොදු පරීක්ෂණය**
பொதுச் சாதாரணப் பரீட்சை
Common General Test

**12 S**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**
- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරා ගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

**1.** ඉන්දීය ජනාධිපතිවරයා, 2020 වර්ෂය සඳහා ආචාර්ය වජිරා චිත්‍රසේනට ප්‍රදානය කරන ලද ගෞරවනීය සම්මානයක් 2021 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස්වරයා විසින් ඇය වෙත බාරදෙනු ලැබිණි. මෙම සම්මානයේ නම කුමක් ද?

(1) අර්ජුන සම්මානය (2) පද්ම විභූෂණ (3) පද්ම භූෂණ
(4) භාරත රත්න (5) පද්ම ශ්‍රී

**2.** වර්ෂ 2022 දී පොදු රාජ්‍ය මණ්ඩලය, අභාවප්‍රාප්ත දෙවන එලිසබෙත් රැජින 1952 පෙබරවාරි 6 වන දින බ්‍රිතාන්‍ය කිරුළ පළඳිනු ලැබීමේ 70 වැනි සංවත්සරය සැමරීය. මෙම උත්සවය හඳුන්වනු ලැබුවේ,

(1) පද්මරාග (රූබි) ජුබිලිය ලෙස ය. (2) ප්ලැටිනම් ජුබිලිය ලෙස ය.
(3) ස්වර්ණමය ජුබිලිය ලෙස ය. (4) දියමන්ති ජුබිලිය ලෙස ය.
(5) ඉන්ද්‍රනීල (සැපයර්) ජුබිලිය ලෙස ය.

**3.** ශ්‍රී ලංකාවේ විශාලතම සිමෙන්ති කර්මාන්තශාලාව වන සීමාසහිත ලංවා සංස්ථා සිමෙන්ති (පෞද්ගලික) සංස්ථාව 2022 මාර්තු මාසයේදී උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම කර්මාන්තශාලාව පිහිටා ඇත්තේ පහත දැක්වෙන කවර අපනයන සැකසුම් කලාපය (EPZ) තුළ ද?

(1) මිරිජ්ජවිල EPZ (2) සීතාවක EPZ (3) මාවතගම EPZ
(4) හොරණ EPZ (5) පොල්ගහවෙල EPZ

**4.** කොරෝනා වෛරස රෝගය - 2019 (COVID-19) හි මෙතෙක් හඳුනාගනු ලැබූ ප්‍රභේද කිහිපයක්ම ඇත. එම ප්‍රභේද අතරට **නොගැනෙන්නේ** පහත දැක්වෙන කවරක් ද?

(1) ඇල්ෆා (2) බීටා (3) ගැමා (4) ඩෙල්ටා (5) එප්සිලොන්

**5.** රුසියාව 2022 පෙබරවාරි මාසයේදී නැගෙනහිර යුරෝපීය රටක ඇවැන්ත හමුදා ක්‍රියාන්විතයක් ආරම්භ කළේ ය. එම රටෙහි නම කුමක් ද?

(1) පෝලන්තය (2) බෙලරුස් (3) ස්ලෝවැකියා (4) මොල්ඩෝවා (5) යුක්රේනය

**6.** 2021 අගෝස්තු මාසයේදී ඇෆ්ගනිස්ථානයෙහි ආණ්ඩුවක් පිහිට වූ දේශපාලන ව්‍යාපාරයේ නම කුමක් ද?

(1) හමාස් (2) අල්-කයිඩා (3) තලේබාන් (4) බෝකෝ හරාම් (5) හිස්බුල්ලා

**7.** ශ්‍රී ලංකාවේ ආබාධිත ක්‍රීඩකයකු වන දිනේෂ් ප්‍රියන්ත හේරත්, 2021 අගෝස්තු මාසයේ පැවති ප්‍රධාන ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලියකදී පිරිමි හෙල්ල විසිකිරීමේ F46 කාණ්ඩයේ නව ලෝක වාර්තාවක් තබමින් රන් පදක්කම දිනාගත්තේ ය. මෙම තරගාවලිය කුමක් ද?

(1) ආසියානු පැරා ක්‍රීඩා (2) ටෝකියෝ පැරාලිම්පික්
(3) පැරපන් අමෙරිකානු ක්‍රීඩා (4) පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා
(5) විශේෂ ඔලිම්පික්

**8.** බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව (BIMSTEC) යනු දකුණු සහ අග්නිදිග ආසියානු ජාතීන් හතකින් සැදුම්ලත් ජාත්‍යන්තර සංවිධානයකි. 2022 මාර්තු මාසයේදී පැවති පස්වන BIMSTEC සමුළුවෙහි සත්කාරකයා වූයේ ශ්‍රී ලංකා රජයයි. BIMSTEC හි සාමාජිකයකු **නොවන්නේ** පහත දැක්වෙන කුමන රට ද?

(1) පාකිස්ථානය (2) බංග්ලාදේශය (3) භූතානය (4) ඉන්දියාව (5) නේපාලය

[දෙවැනි පිටුව බලන්න.

9. හරිතාගාර වායු හඳුනාගැනෙන්නේ පෘථිවි වායුගෝලයෙහි තාපය රඳවාගන්නා වායු ලෙස ය. හරිතාගාර වායුවක් **නොවන්නේ** පහත සඳහන් කුමන වායුව ද?
(1) හයිඩ්රොෆ්ලෝරෝකාබන (2) මීතේන් (3) නයිට්‍රස් ඔක්සයිඩ (4) කාබන්ඩයොක්සයිඩ් (5) හයිඩ්‍රජන්

10. එක්සත් ජාතීන්ගේ සංවිධානයට (UNO) සෘජුවම සම්බන්ධ **නොවන්නේ** පහත දැක්වෙන කුමන සංවිධානය ද?
(1) ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)
(2) දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමය (SAARC)
(3) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
(4) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
(5) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)

11. සුපිරි වෙළෙඳසලක, ගනුදෙනුකරුවකු රු. 5000 ඉක්මවා වැයකරන සෑම රුපියලකටම රු. 1500 ක උපරිම වට්ටම් අගයකට යටත්ව 12% ක මිල අඩු කිරීමක් ලබා දෙන අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක වේ. උපරිම වට්ටම ලබා ගැනීම සඳහා අවශ්‍ය අවම බිල්පත් අගය කීය ද?
(1) රු. 12 500 (2) රු. 12 501 (3) රු. 17 500 (4) රු. 17 501 (5) රු. 18 000

12. පද්මා සහ ශ්‍රියානි යනු සමාගමක දත්ත සටහන් ක්‍රියාකාරිනියන් දෙදෙනෙකි. පද්මා පිටු 36 ක දත්ත පරිගණකගත කිරීමට පැය 5 ක් ගන්නා අතර, ශ්‍රියානි පිටු 48 ක් සඳහා පැය 6 ක් ගනියි. ඔවුන් දෙදෙනාට එක්ව පරිගණක දෙකකට වෙන වෙන ම පිටු 171 ක දත්ත ඇතුළු කිරීමට පවරන ලදි. ඒ සඳහා ඔවුහු කොපමණ වේලාවක් ගනිත් ද?
(1) පැය 09 මිනිත්තු 15 (2) පැය 10 මිනිත්තු 15 (3) පැය 10 මිනිත්තු 25 (4) පැය 11 මිනිත්තු 15 (5) පැය 11 මිනිත්තු 25

13. 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ටෙස්ට් තරග, එක්දින ජාත්‍යන්තර තරග සහ T20 ජාත්‍යන්තර තරග ජයගැනීමේ ප්‍රතිශත පිළිවෙළින් 33, 29 සහ 40 වේ. එම වකවානුව තුළ ටෙස්ට් තරග සහ එක්දින ජාත්‍යන්තර තරග ජයගැනීමේ සංයුක්ත මධ්‍යක ප්‍රතිශතය 30 ද එක්දින ජාත්‍යන්තර තරග සහ T20 ජාත්‍යන්තර තරග ජයගැනීමේ සංයුක්ත මධ්‍යක ප්‍රතිශතය 35 ද වේ. 2021 දී ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම මෙම තරග වර්ග තුනම ජයගැනීමේ සංයුක්ත මධ්‍යක ප්‍රතිශතය, ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටැයූ විට කීය ද?
(1) 27 (2) 32 (3) 35 (4) 38 (5) 40

14. දුම්රියක් ප.ව. 1.00 ට මාතරින් පිටත්ව ප.ව. 6.20 ට මරදානට ළඟාවෙයි. තවත් දුම්රියක් ප.ව. 3.00 ට මරදානෙන් පිටත්ව ප.ව. 6.40 ට මාතරට ළඟාවෙයි. මාතර සහ මරදාන අතර දුර 160 km ද, දුම්රිය දෙක ම නියත වේගවලින් ගමන් කරයි ද නම්, දුම්රිය දෙක එකිනෙක හමුවන වේලාව කීය ද?
(1) ප.ව. 3.07 (2) ප.ව. 3.57 (3) ප.ව. 4.02 (4) ප.ව. 4.22 (5) ප.ව. 4.32

15. $A$ සහ $B$ නම් සුපිරි වෙළෙඳසල් දෙකක් එක්තරා ආහාර ද්‍රව්‍යයක් අලෙවි කරන්නේ, එහි ලකුණු කළ මිලෙන් පිළිවෙළින් 10% සහ 15% වට්ටම් සහිතව ය. එක් දිනක අතිරේක අලෙවි ප්‍රවර්ධන ක්‍රියාකාරකමක් හේතුවෙන් $A$ සහ $B$ වෙළෙඳසල් එම ආහාර ද්‍රව්‍යය සඳහා පළමුවෙන් වට්ටම් ලබාදීමෙන් පසු ලැබෙන මිලට තවදුරටත් 15% සහ 20% බැගින් වන වට්ටම් පිළිවෙළින් ලබා දෙන බව ද ඒ අනුව වෙළඳසල් දෙකෙහි මිල ගණන් අතර රු. 20 ක වෙනසක් පවතින බව ද නිමල් දැනගනියි. මෙම ආහාර ද්‍රව්‍යයෙහි ලකුණු කළ මිල, ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටැයූ විට රුපියල්වලින් කීය ද?
(1) 135 (2) 235 (3) 245 (4) 335 (5) 345

16. සිල්වා මහතා එක් සෙනසුරාදාවක නිවැරදි වේලාව වූ පෙ.ව. 9.00 ට, සිය අත්ඔරලෝසුවෙහි සීනුව ඊළඟ සඳුදා පෙ.ව. 11.00 ට නාදවන ලෙස සකස් කරයි. ඔහුගේ අත්ඔරලෝසුව දෝෂ සහිත බවත්, සෑම පැය 24 කටම මිනිත්තු 20 බැගින් වැඩියෙන් වේලාව දක්වන බවත් ඔහු නොදනියි. සීනුව නාදවන විට නිවැරදි වේලාව කුමක් වේ ද?
(1) පෙ.ව. 10.00 පසුවී මිනිත්තු 18 තත්පර 54
(2) පෙ.ව. 10.00 ට මිනිත්තු 18 තත්පර 54 කට පෙර
(3) පෙ.ව. 10.00 පසුවී මිනිත්තු 15 තත්පර 20
(4) පෙ.ව. 10.00 ට මිනිත්තු 15 තත්පර 20 කට පෙර
(5) ප.ව. 10.00 පසුවී මිනිත්තු 18 තත්පර 54

17. අවුරුද්දකට පෙර අනුලාගේත් අනුරගේත් වයස් අතර අනුපාතය $3:4$ විය. අවුරුදු තුනකට පසු එම අනුපාතය $5:6$ බවට පත්වේ. අනුලාගේ දැන් වයස කීය ද?
(1) අවුරුදු 6 (2) අවුරුදු 7 (3) අවුරුදු 8 (4) අවුරුදු 9 (5) අවුරුදු 10

18. දුම්රියක්, දුම්රිය මාර්ගයට සමාන්තර පාරක් දිගේ $2\ km\ h^{-1}$ සහ $4\ km\ h^{-1}$ වේගවලින් ගමන් කරන මිනිසුන් දෙදෙනකු පසුකරයි. දුම්රියත්, මිනිස්සු දෙදෙනාත් එකම දිශාවකට ගමන් කරයි. දුම්රිය මෙම එක් එක් මිනිසා මුළුමනින්ම පසුකිරීමට පිළිවෙළින් තත්පර 36 ක් සහ තත්පර 40 ක් ගනියි නම්, දුම්රියේ දිග කොපමණ ද?
(1) 100 m (2) 150 m (3) 180 m (4) 200 m (5) 250 m

[තුන්වැනි පිටුව බලන්න.

**19.** පෙරේරා මහත්මිය එක්තරා මුදලක් බැංකුවක තැන්පත් කරනුයේ අදාළ කාලය තුළ එකම සුළුපොලී අනුපාතිකයක් යටතේ එම මුදල අවුරුදු පහකදී රු. මිලියන 2.55 ක් ද අවුරුදු අටකදී රු. මිලියන 3.18 ක් ද දක්වා වර්ධනය වෙතැයි අපේක්ෂාවෙනි. පෙරේරා මහත්මියට බැංකුව මගින් ගෙවනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය කොපමණ ද?

(1) 12 % (2) 12.5 % (3) 14 % (4) 14.5 % (5) 15 %

**20.** ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ආයතනයක් පසුගිය මාසයේදී 20 : 6 : 1 අනුපාතයට වූ ගෘහසේවිකා, හෙදි හා කාර්මික ශිල්පී කණ්ඩායමක් ඕමානයට යවා ඇත. මේ ක්ෂේත්‍රවල ඒකපුද්ගල මාසික වැටුප් පිළිවෙළින් 2 : 7 : 6 අනුපාතයට විය. ආයතනය මගින් යවන ලද හෙදියන් සංඛ්‍යාව 30 ක් ද සමස්ත කණ්ඩායමෙහි මුළු මාසික වැටුප ඕමාන් රියාල් (OR) 26 400 ක් ද වූයේ නම්, දී ඇති අනුපිළිවෙළින් එක් එක් ක්ෂේත්‍රයේ එක් පුද්ගලයකුට ගෙවන ලද මාසික වැටුප් කවරේ ද?

(1) 120 OR, 420 OR, 280 OR
(2) 120 OR, 420 OR, 360 OR
(3) 130 OR, 420 OR, 260 OR
(4) 150 OR, 450 OR, 250 OR
(5) 160 OR, 420 OR, 260 OR

- අංක **21** සහ **22** ප්‍රශ්න පාදක වන්නේ, *n* යන සංඛ්‍යාව නිරූපණය කිරීම සඳහා කුඩා වෘත්ත *n* ගණනක් යොදාගත් 'යුනරියාව' නමැති කල්පිත ශිෂ්ටාචාරයකින් සොයාගනු ලැබූ පහත දැක්වෙන නිවැරදි සමීකරණ තුන මත ය.

○ ○ ○ ? ○ / ○ ○ ○ ○
○ ○ ○ # ○ ○ / ○
@ ○ ○ ? ○ ! & ○ / ○ ○ ○


**21.** පහත දැක්වෙන කුමන යුනරියානු සමීකරණය **වැරදි** ද?


(1) ○ # @ ○ & ○ ! / ○
(2) @ ○ ○ # ○ ! & ○ ○ / ○ ○
(3) ○ ? @ ○ ○ & ○ ! / ○ ○ ○
(4) ○ ? @ ○ & ○ ! / ○ ○
(5) ○ ○ # @ ○ & ○ ! / ○

**22.** පහත දැක්වෙන කුමන යුනරියානු ප්‍රකාශනය, ඉතිරි නැතිව 3න් බෙදේ ද?

(1) @ ○ ? ○ ○ ! & ○ ○
(2) @ ○ ○ # ○ ! & ○ ○
(3) ○ ○ & @ ○ # ○ ○ !
(4) ○ ? ○ ? ○ ○
(5) ○ ○ ? @ ○ & ○ ○ !


**23.** එකිනෙකට ලම්බව සවිකර ඇති තල දර්පණ දෙකක් ඉදිරියෙන් තබා ඇති ඔරලෝසුවක මුහුණත රූපයේ දැක්වේ. දර්පණ තුළින් බලන විට, හිස් වෘත්තය මගින් දක්වා ඇති ස්ථානයේ දැකිය හැකි නිවැරදි ප්‍රතිබිම්බය දැක්වෙන්නේ පහත දී ඇති කවර රූපයේ ද?





(1) (2) (3) (4) (5)

**24.** සමචතුරස්‍ර හයකින් සමන්විත පතරොමක් රූපයේ දැක්වේ. සෑම සමචතුරස්‍රයක් තුළ ම ජ්‍යාමිතික රූපයක් ඇඳ ඇත. මෙම පතරොම භාවිත කර ඝනකයක් සාදනු ලබන්නේ ඝනකයේ මුහුණත් මත මෙම රූප හය දැකිය හැකි වන පරිදි ය. □, ⊠ සහ ○ රූප දැක්වෙන මුහුණත් තුනට පිළිවෙළින් ප්‍රතිවිරුද්ධ මුහුණත් මත දැක්වෙනුයේ පහත දැක්වෙන කවර රූප ත්‍රිත්වය ද?



(1) ▤, ⊗ සහ ●
(2) ▤, ● සහ ⊗
(3) ⊗, ▤ සහ ●
(4) ⊗, ● සහ ▤
(5) ●, ▤ සහ ⊗

**25.** සමද්විපාද සෘජුකෝණී ත්‍රිකෝණාකාර බිත්තියක් එහි සෘජුකෝණය අහස දෙසට යොමුවන සේ සමමිතිකව ස්ථාපනය කර ඇත. මෙම බිත්තිය, ඒකක වර්ගඵලයකට නියත අනුපාතිකයක් යටතේ පතුලේ සිට මුදුන තෙක් තීන්ත ආලේප කරන ලද නම් සහ උසින් හරි අඩක් තෙක් ආලේප කිරීමට රු. 6000 ක් වැයවිණි නම්, තීන්ත ආලේපය සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද?

(1) රු. 7000 (2) රු. 8000 (3) රු. 10 000 (4) රු. 12 000 (5) රු. 15 000

- අංක **26** සිට **30** තෙක් ප්‍රශ්න සඳහා, තෙල්නැතිගම ඉන්ධන පිරවුම්හලෙහි ඊළඟ සතියේ පෙට්‍රල් සහ ඩීසල් තිබීම පිළිබඳව ඉරු දිනක ඇති වූ පහත දැක්වෙන සංවාදය සලකා බලන්න.

අමල් : ඊළඟ දවස් දෙකේ ම තෙල් බවුසරයක් මේ පැත්තට එන්නේ නෑ. මිනිස්සු නිස්කාරණේ පෝලිමේ රස්තියාදු වෙන්නේ. නමුත් බදාදා පාන්දරම පෙට්‍රලුත් ඩීසලුත් දෙක ම එනවා. ඒවා දවස් තුනකට හෝ බාගදා ඊටත් වැඩි කාලෙකට සෑහෙනවා.

භවන් : අනේ යාළුවේ, බදාදා මොන පෙට්‍රල් ද! අනික, බ්‍රහස්පතින්දා ඩීසල් නෑ.

කාසිම් : අයියෝ, ඇයි දන්නැද්ද, දැනටමත් තෙල්නැතිගම ෂෙඩ් එකේ පෙට්‍රලුත් ඩීසලුත් දෙක ම තියෙනවා. අපරාදේ, එත් බ්‍රහස්පතින්දා රෑ වෙනකොට ඒවා ඉවර වෙනවා. ඒ කියන්නේ, සිකුරාදා තෙල් නෑ.

ඩේවිඩ් : මට බදාදා කෙනෙක්ව ගිහින් ඇරලවන්න සිද්දවෙන්න පුළුවන්. මට සහතිකයි, එදාට පෙට්‍රලුත් ඩීසලුත් දෙක ම තියෙනවා.

එමිල් : යාළුවනේ, ඇයි අලුත් බවුසර් එන්න බැරි ද? මට සහතිකයි, බ්‍රහස්පතින්දාත් සිකුරාදාත් දෙකේ ම පෙට්‍රලුත් ඩීසලුත් තියෙන්නම ඕනෑ.

**26.** බදාදා මධ්‍යම රාත්‍රිය තෙක් පෙට්‍රල් නොලැබේ නම්, කී දෙනකු නිශ්චිතව ම **අසත්‍ය** ප්‍රකාශ කරන්නන් වේ ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

**27.** බ්‍රහස්පතින්දා ඩීසල් තිබුණහොත්, කී දෙනකු නිශ්චිතවම **අසත්‍ය** ප්‍රකාශ කරන්නන් වේ ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

**28.** එක් අයකු පමණක් සත්‍ය ප්‍රකාශ කළේ යැයි සලකන්න. බ්‍රහස්පතින්දා ඩීසල් තිබුණහොත් සහ සිකුරාදා පෙට්‍රල් නොතිබුණහොත්, සත්‍ය ප්‍රකාශ කළේ කවුරුන් ද?

(1) අමල් (2) භවන් (3) කාසිම් (4) ඩේවිඩ් (5) එමිල්

**29.** දෙදෙනකු පමණක් සත්‍ය ප්‍රකාශ කළේ නම්, තෙල්නැතිගම ඉන්ධන පිරවුම්හලෙහි නොවරදවාම ඩීසල් තිබිය යුතු දවස් දෙක වන්නේ,

(1) සඳුදා සහ අඟහරුවාදා ය. (2) අඟහරුවාදා සහ බදාදා ය.
(3) බදාදා සහ බ්‍රහස්පතින්දා ය. (4) බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ය.
(5) බදාදා සහ සිකුරාදා ය.

**30.** වැඩිම පුද්ගලයින් සංඛ්‍යාවක් සත්‍ය ප්‍රකාශ කරත් නම්, පහත දැක්වෙන කවර ප්‍රකාශය සත්‍ය වේ ද?

(1) අඟහරුවාදා පෙට්‍රල් තිබෙන අතර සඳුදා ඩීසල් නැත.
(2) බ්‍රහස්පතින්දා පෙට්‍රල් තිබෙන අතර සඳුදා ඩීසල් නැත.
(3) සඳුදා පෙට්‍රල් නොතිබෙන අතර අඟහරුවාදා ඩීසල් ඇත.
(4) අඟහරුවාදා පෙට්‍රල් නොතිබෙන අතර බදාදා ඩීසල් නැත.
(5) බ්‍රහස්පතින්දා පෙට්‍රල් නොතිබෙන අතර බදාදා ඩීසල් ඇත.

**31.** පුද්ගලයන් දහදෙනකු අහඹු ලෙස තෝරාගනු ලැබ ඇතැයි සලකන්න. ඔවුන් පිළිබඳව දී ඇති ප්‍රකාශ නිශ්චිතවම සිදුවන (A), සිදුවීමට හැකි (B), සිදුවීමේ ඉඩ බෙහෙවින් අඩු (C) සහ කිසිසේත් සිදු නොවන (D) ලෙස වර්ග කරන්න.

1. සතියේ එකම දවසේ උපන් දෙදෙනෙක් සිටිති.
2. 2021 දී හරියට ම එකම වචන සංඛ්‍යාවක් කියවා ඇති දෙදෙනෙක් සිටිති.
3. දකුණත් හුරු කාන්තාවෝ දෙදෙනෙක් සිටිති.
4. මානසික සංජානන සර්වසම වන දෙදෙනෙක් සිටිති.

(1) A, C, B, D (2) B, C, A, D (3) B, D, A, C (4) C, B, A, D (5) D, C, B, A

**32.** "සෑම නිවසක ම දර ලිපක් සහ විදුලි උදුනක් තිබෙන අතර, ඒවායින් කවරක් හෝ පාවිච්චියට ගනු ලබන්නේ ගෑස් නැති විට පමණි."

ඉහත ප්‍රකාශය දුර්වල කරනු පිණිස රැස් කරගනු ලැබූ පහත සාක්ෂ්‍ය අතුරෙන් දුර්වල ම සාක්ෂ්‍යය තෝරන්න.

(1) ගෑස් උදුනක් සමග දර ලිප ද භාවිත කෙරෙන, දර ලිපක් සහ විදුලි උදුනක් සහිත නිවසක්
(2) ගෑස් හිඟ වූ විට භාවිත කෙරෙන දර ලිපක් ඇතත් විදුලි උදුනක් නොමැති නිවසක්
(3) ගෑස් හිඟ වූ විට භාවිත කෙරෙන දර ලිපක් සහ ගෑස් උදුන සමග එකට භාවිත කෙරෙන විදුලි උදුනක් සහිත නිවසක්
(4) දර ලිපක් හා විදුලි උදුනක් ඇති සහ ගෑස් උදුන සමග මේ දෙක ම භාවිත කෙරෙන නිවෙස් දහසක්
(5) ගෑස් උදුන් සමග එකවර භාවිත නොකෙරෙන දර ලිප් හෝ විදුලි උදුන් හෝ ඇති නිවෙස් දස දහසක්

- අංක **33** සහ **34** ප්‍රශ්න සඳහා පහත දී ඇති තොරතුරු සලකා බලන්න.

ගවේෂණ චාරිකාවක් අතරතුර වනයේ අතරමං වූ ටීනා සහ සීනා යන ගවේෂිකාවන් දෙදෙනා උත්සාහ කරනුයේ, සංඥා නිකුත් කිරීමේ සහ ග්‍රහණය කරගැනීමේ පරාසය 500 m ක් වූ සංඥා උපකරණයක් ඇති ව කඳවුරට වී සිටින මීනා සමඟ සම්බන්ධ වන්නට ය. ටීනා කඳවුරට 7 km ක් උතුරින් ද සීනා කඳවුරට 13 km ක් බටහිරින් ද සිටින අතර, එකම අවස්ථාවකදී ඔවුහු දෙදෙනාම කඳවුර දෙසට ගමන් කිරීම අරඹති. ටීනා 6 km පරාසයක බලපවත්වන සංඥා උපකරණයක් රැගෙන $6\ km\ h^{-1}$ වේගයෙන් ඇවිදින අතර, සීනා 7 km පරාසයක බලපවත්වන සංඥා උපකරණයක් රැගෙන $3\ km\ h^{-1}$ වේගයෙන් ඇවිදියි.


**33.** ටීනාගේ සංඥා උපකරණය මීනාගේ සංඥා ලබාගැනීම අරඹනුයේ කවර විටෙකදී ද?

(1) මිනිත්තු 05 කදී (2) මිනිත්තු 10 කදී (3) මිනිත්තු 20 කදී
(4) මිනිත්තු 30 කදී (5) මිනිත්තු 45 කදී

**34.** ටීනා සහ සීනා එකිනෙකාගේ සංඥා ලබාගැනීම අරඹනුයේ කවර විටෙකදී ද?

(1) මිනිත්තු 05 කදී (2) මිනිත්තු 10 කදී (3) මිනිත්තු 20 කදී
(4) මිනිත්තු 30 කදී (5) මිනිත්තු 45 කදී

- අංක **35** සහ **36** ප්‍රශ්න සඳහා, පුද්ගලයින් 5000 කට අඩු සංඛ්‍යාවක් ඇති එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) බල ප්‍රදේශයක COVID එන්නතෙහි හතරවන මාත්‍රාව ලබාගෙන ඇති පුද්ගලයින් සංඛ්‍යාව දැක්වෙන පහත දී ඇති ප්‍රස්තාරය සලකා බලන්න.




**35.** පෙබරවාරි සිට ජුනි තෙක්, මෙම MOH බල ප්‍රදේශය තුළ වැඩිම එන්නත්කරණයක් වාර්තා වූ මාසය කුමක් ද?

(1) පෙබරවාරි (2) මාර්තු (3) අප්‍රේල් (4) මැයි (5) ජුනි

**36.** පෙබරවාරි සිට ජුනි තෙක්, මෙම MOH බල ප්‍රදේශය තුළ අඩුම එන්නත්කරණයක් වාර්තා වූ මාසය කුමක් ද?

(1) පෙබරවාරි (2) මාර්තු (3) අප්‍රේල් (4) මැයි (5) ජුනි

- අංක **37** සිට **39** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

පාසලකින් පසුගිය වර්ෂයේදී අ.පො.ස.(උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් අතුරෙන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ඉහළ ම ලකුණු ලැබූ හත්දෙනා *A*, *B*, *C*, *D*, *E*, *F* සහ *G* වූහ. ඔවුන් අතුරෙන් කිසිදු දෙදෙනකුගේ ලකුණු සමාන නොවී ය. ඔවුන්ගේ ලකුණු අවරෝහණ පිළිවෙළට සකස් කර ඔවුනට ඒ අනුව පිළිවෙළින් 1, 2, 3, ..., 7 යන ස්ථාන ලබාදෙන ලදි. මෙම සිසුහු හත්දෙනා රවුම් මේසයක් වටා එහි කේන්ද්‍රය දෙසට මුහුණ ලා වාඩි වී සිටියහ. පහත සඳහන් තොරතුරු ද සපයා තිබේ.

∗ *A* පිරිමි ළමයෙකි. ලකුණු අනුව ඔහු හයවැනියා වේ.
∗ *D*, *F* සහ *G* පිරිමි ළමයි ද, *C* සහ *E* ගැහැනු ළමයි ද වෙති.
∗ ලකුණු අනුව *C* පස්වැනියා වන නමුත්, *D* හතරවැනියා **නොවේ**.
∗ *C* දෙපසින් වාඩි වී සිටියේ ගැහැනු ළමයින් දෙදෙනෙකි. *G* වාඩි වී සිටියේ *C* ගේ වම්පසින් තුන්වැනි ආසනයේ ය.
∗ *C* අසලින්ම වම්පසින් *E* වාඩි වී සිටි අතර, ලකුණු අනුව හත්වැනියා *C* අසලින්ම දකුණු පසින් වාඩි වී සිටියේ ය.
∗ *C* සහ ලකුණු අනුව හතරවැනියා අතර එක් සිසුවෙක් පමණක් වාඩි වී සිටියේ ය.
∗ *D* සහ *F* අතර ද එක් සිසුවෙක් පමණක් වාඩි වී සිටියේ ය.
∗ ලකුණු අනුව දෙවැනියා සහ හයවැනියා අතර සිසුහු දෙදෙනෙක් වාඩි වී සිටියෝ ය.

**37.** ලකුණු අනුව *F* ගේ ස්ථානය කුමක් ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 7

**38.** ලකුණු අනුව දෙවැනි ස්ථානය හිමි කරගත්තේ කවුරුන් ද?

(1) *B* (2) *D* (3) *E* (4) *F* (5) *G*

**39.** සිසුන් දෙදෙනකුට ලකුණු අනුව හිමිවන ස්ථාන නිර්ණය කිරීමට, සපයා ඇති තොරතුරු ප්‍රමාණවත් **නොවේ**. මෙම සිසුහු දෙදෙනා කවරහු ද?

(1) *B* සහ *D* (2) *D* සහ *E* (3) *D* සහ *F* (4) *D* සහ *G* (5) *E* සහ *F*

[හයවැනි පිටුව බලන්න.

- අංක **40** සිට **42** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ:

වෘත්තීය පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) ඩිප්ලෝමා පාඨමාලාවකට ඇතුළත්වීම සඳහා පහත දැක්වෙන අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියෝ සුදුසුකම් ලබති.

1. වයස : 2023 ජනවාරි 1 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 22 ට නොවැඩි වීම.
2. අධ්‍යාපන සුදුසුකම් : පහත සඳහන් ඕනෑම විකල්පයක් සලකා බැලේ.

| **විකල්පය** | **අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය (එක් වරකදී)** | **සාමාන්‍ය තොරතුරු තාක්ෂණ (GIT) විභාගය** |
|---|---|---|
| (i) | ICT, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව සඳහා C හෝ ඊට ඉහළ ශ්‍රේණි සහිතව විෂය හයක් සමත්වීම | S හෝ ඊට ඉහළ ශ්‍රේණියක් |
| (ii) | ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව සඳහා C හෝ ඊට ඉහළ ශ්‍රේණි හා ICT සඳහා S ශ්‍රේණියක් සහිතව විෂය හයක් සමත් වීම | C හෝ ඊට ඉහළ ශ්‍රේණියක් |
| (iii) | ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව සඳහා C හෝ ඊට ඉහළ ශ්‍රේණි සහිතව විෂය හයක් සමත්වීම | A හෝ B ශ්‍රේණියක් |

**සටහන** : GIT විභාගයෙන් අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත්, ආයතනය මගින් පවත්වනු ලබන ICT සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයට අයදුම්කරු පෙනී සිට GIT විභාගයට අදාළ ශ්‍රේණි ලබාගැනීමේ එකඟතාව මත සලකා බලනු ලැබේ.

පහත සඳහන් ශ්‍රී ලාංකික අයදුම්කරුවන් පස්දෙනාගේ දී ඇති තොරතුරු සලකා බලන්න.

අනිල් : උපන්දිනය 2004.01.01 වේ. 2020 අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි සහ ICT ඇතුළුව විෂය හයක් සඳහා A ශ්‍රේණි ලබා ඇත. GIT විභාගයට පෙනී සිට නැත.

භාරතී : උපන් වර්ෂය 2001 වේ. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ එක් වරකදී ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි සහ ICT සමග තවත් විෂය දෙකකට C ශ්‍රේණි ලබා ඇති අතර, GIT විභාගයෙන් ද C ශ්‍රේණියක් ලබා ඇත.

චිත්‍රා : උපන් වර්ෂය 2003 වේ. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරකදී ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂය හයක් සඳහා C ශ්‍රේණි සහ ICT සඳහා S ශ්‍රේණියක් ද GIT විභාගයෙන් C ශ්‍රේණියක් ද ලබා ඇත.

දේවි : උපන් වර්ෂය 2000 වේ. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය එක් වරකදී ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි සහ ICT යන විෂය ඇතුළුව C ශ්‍රේණි අටක් සහිතව සමත්ව ඇත. GIT විභාගය සඳහා පෙනී සිට නැත.

එමා : උපන් වර්ෂය 2003 වේ. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරකදී ඉංග්‍රීසි සහ ICT සඳහා S ශ්‍රේණි ද ගණිතය සහ විද්‍යාව ඇතුළුව වෙනත් විෂය හයක් සඳහා C ශ්‍රේණි ද ලබා ඇත. GIT විභාගයේදී B ශ්‍රේණියක් ලබා ඇත.

**40.** ඉහත සඳහන් අයදුම්කරුවන් පස්දෙනා අතුරෙන්, අයදුම්පත සලකා බලනු ලැබීම සඳහා ICT සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය වන අයදුම්කරුවා කවුරුන් ද?

(1) අනිල් (2) භාරතී (3) චිත්‍රා (4) දේවි (5) එමා

**41.** ICT සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයට පෙනී නොසිටම ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළුවීම සඳහා යෝග්‍යතාව ලබා ඇති අයදුම්කරුවන් කවුරුන් ද?

(1) අනිල් සහ භාරතී (2) භාරතී සහ චිත්‍රා (3) චිත්‍රා සහ දේවි
(4) දේවි සහ එමා (5) එමා සහ අනිල්


**42.** මෙම කවර විකල්පය යටතේ වුව ද ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළුවීම සඳහා යෝග්‍යතාව සපුරා **නොමැති** අයදුම්කරුවන් කවුරුන් ද?

(1) අනිල් සහ භාරතී (2) භාරතී සහ චිත්‍රා (3) චිත්‍රා සහ දේවි
(4) දේවි සහ එමා (5) එමා සහ අනිල්

- අංක **43** සහ **44** ප්‍රශ්න, පහත දී ඇති තොරතුරු මත පදනම් වේ:

තිරස් සෘජුකෝණාස්‍රය, සිරස් සෘජුකෝණාස්‍රය සහ ඇල සෘජුකෝණාස්‍රය, පාසලක 13 වන ශ්‍රේණියේ භෞතික විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂය හදාරන ශිෂ්‍ය සංඛ්‍යා පිළිවෙළින් දක්වයි.

මෙම පාසලේ ජෛවීය විද්‍යා අංශයෙහි සෑම සිසුවකුම විෂය තුනක් හදාරන අතර, ඒවායින් ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව අනිවාර්ය වේ. මෙම සිසුන්ගේ අනෙක් විෂයය භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හෝ වේ. තව ද ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව හෝ හදාරන සියලුම සිසුහු රසායන විද්‍යාව ද හදාරති.




**43.** මෙම පාසලේ 13 වන ශ්‍රේණියේ, ජෛවීය විද්‍යා අංශයෙහි සිසුහු කී දෙනෙක් සිටිත් ද?

(1) 110 (2) 120 (3) 130 (4) 140 (5) 150

**44.** 13 වන ශ්‍රේණියේ, රසායන විද්‍යාව විෂයය හදාරන අවම ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද?

(1) 120 (2) 170 (3) 210 (4) 250 (5) 290

**45.** මෙම ප්‍රශ්නයෙහි, 1 සහ 7 මගින් අංකනය කර ඇති වාක්‍ය දෙක අතර ඇති *A, B, C, D, E* වාක්‍ය ඒවායේ නියමිත පටිපාටියෙහි **නොමැත**. වඩාත් තාර්කික වාක්‍ය හතකින් යුත් අනුක්‍රමයක් ගොඩනැගීම සඳහා උචිත පිළියෙල කිරීම තෝරන්න.

1 – සාන්තන් සිය අ.පො.ස.(සා.පෙළ) සහතිකයේ මුල්පිටපත අස්ථානගතවීම පිළිබඳව කනස්සල්ලට පත්ව සිටී.

*A* – ශ්‍රී ලංකාව තුළ සියලුම අවශ්‍යතාවලට ප්‍රමාණවත් සහතිකයක් ලබා දිය හැකි බව විදුහල්පතිවරයා ඔහුට පැවසී ය.

*B* – සාන්තන් විදුහල්පතිවරයාට ස්තුති කරමින්ම, තමාට විදේශීය විශ්වවිද්‍යාලයකට ඉදිරිපත් කිරීම සඳහා තවත් සහතිකයක් විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා ක්‍රියාපටිපාටිය කුමක් දැයි විමසී ය.

*C* – එබැවින් තවත් මුල් පිටපතක් හෝ ඊට සමාන සහතිකයක් ලබාගැනීම සඳහා සාන්තන් විදුහල්පතිවරයාගෙන් උපදෙස් විමසුවේ ය.

*D* – අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සහතිකයේ ඡායාපිටපතක්, ඉදිරි අධ්‍යයන කටයුතුවලට හෝ රැකියාවක් සඳහා සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට හෝ ප්‍රමාණවත් නොවන බව සාන්තන් දනියි.

*E* – බැංකුවක විද්‍යුත් ගනුදෙනු හරහා මුදල් ගෙවීමෙන් මාර්ගගත (online) ක්‍රමවේදය ඔස්සේ හෝ බත්තරමුල්ල විභාග දෙපාර්තමේන්තුවට යාමෙන් සෘජුවම හෝ සහතික පිටපත් එකේ සිට තුන තෙක් සංඛ්‍යාවක් ලබාගත හැකි බව විදුහල්පතිවරයා සාන්තන්ට පැහැදිලි කළේ ය.

7 – විභාග දෙපාර්තමේන්තුවෙන් තවත් සහතිකයක් ලබාගැනීමේ ක්‍රමය දැනගැනීම නිසා සාන්තන් සතුටට පත් විය.

(1) *A,B,C,D,E* (2) *C,A,B,D,E* (3) *C,A,D,B,E* (4) *D,C,A,B,E* (5) *D,C,B,A,E*

**46.** පහත සඳහන් *A, B, C, D* සහ *E* කොටස් පහෙන් එක එකක් ප්‍රකාශ තුනකින් සමන්විත වේ. අර්ථාන්විත අනුක්‍රමයක පිළියෙල කළ හැකි වාක්‍ය අඩංගු වනුයේ ඒවායින් කවර කොටසේ ද?

*A* (*a*) යෝග පුහුණුව පුරාණයේ සිට පැවත එයි.
(*b*) යෝග යනු කිසියම් ආගමික ක්‍රියාකාරකමක පුහුණු කිරීමක් නොවේ.
(*c*) යෝග, කායික සෞඛ්‍යයට පමණක් නොව මානසික සතිමත්භාවයට ද හිතකර වේ.

*B* (*a*) කඳුකරයෙහි නායයෑම්වලට අවකාශ ඇත.
(*b*) කඳුකරයෙහි අධික වර්ෂාව නායයෑම් ඇති කරයි.
(*c*) වතු නිවාසවල වෙසෙන දුප්පත් වතු කම්කරුවෝ නායයෑම් නිසා බොහෝවිට පීඩා විඳිති.

*C* (*a*) නිශාන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවකු වූ නමුත්, ඔහු පුනරුත්ථාපන පන්තිවලට සහභාගි නොවී ය.
(*b*) ඔහු රෝහලට ඇතුළත් කරන විට මිය ගියේ ය.
(*c*) ඔහු හෙරොයින් වැඩි මාත්‍රාවක් ගත් අතර, එය මොළයට අහිතකර ලෙස බලපෑවේ ය.

*D* (*a*) මදුරුවෝ ඩෙංගු පතුරුවති.
(*b*) මදුරුවෝ වෛරස සහ අනෙකුත් ක්ෂුද්‍ර ජීවීන් පතුරුවති.
(*c*) මැලේරියාව පැතිරෙන්නේ මදුරුවන් මාර්ගයෙනි.


*E* (*a*) මෙරටෙහි ජනතාව මුහුණදෙන සමාජ-ආර්ථික ගැටලු කිහිපයකටම ප්‍රධාන හේතුව විදේශ සංචිත හිඟකම වෙයි.
(*b*) අපනයන සහ සංචාරක කර්මාන්තය බිඳවැටීම ප්‍රධාන ගැටලුව වෙයි.
(*c*) ප්‍රමාද වූ මැදිහත්වීම වුව ද වර්තමාන අර්බුදයට සහනයක් සැලසීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට තවමත් හැකි වේ.


(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**47.** පහත දැක්වෙන රූප මගින් විස්තර කෙරෙන සිද්ධිය සලකා බලන්න.


A


B


C


D


E


F

එම සිද්ධියේ නිවැරදි අනුක්‍රමය දෙනු ලබන්නේ රූපවල පහත දැක්වෙන කවර පෙළගැන්වීම මගින් ද?

(1) *A, D, C, F, B, E*
(2) *A, F, D, C, B, E*
(3) *D, C, B, F, A, E*
(4) *F, C, B, D, E, A*
(5) *F, D, C, E, B, A*

- අංක **48** සිට **50** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

සෙනසුරාදා උදෑසනක එක්තරා පුද්ගලයකු සිය බිරිඳට පවසා සිටියේ, තමන්ට කාර්යාලීය වැඩ අධික නිසා, වැඩිමහලු පුතුයා කැටුව වෙළෙඳපළට ගොස් සතියකට සෑහෙන බඩුබාහිරාදිය මිල දී ගන්නා ලෙසයි. වෙළෙඳපළේදී ඔවුනට පුතාගේ ගුරුවරයකු හමුවිය.

පහත *A* සිට *L* තෙක් ඇති දෙබස්, මව, ඇගේ පුතා සහ ගුරුවරයා අතර ඇති වූ සංවාදය දක්වයි. ඔවුන් අතර ඇති වූ සංවාදය නිවැරදි අනුක්‍රමයට පිළියෙල කර **නැත**.

*A*. වෙළෙඳපළේ සෙනඟ ගොඩයි. දැක්කද ඔයාලගේ සර් ?
*B*. ඇත්තටම ඔව්, ඒ අපේ ගණිත සර්, සාරා මහත්මයා.
*C*. අපි පාපැදියෙන් යමු ද?
*D*. අම්මේ, අපි වෙළෙඳපළට යන්නේ බස් එකේ ද? නැත්නම් අපේ පාපැදියෙන් ද?
*E*. ඔව් ඔව්. ඒක පහසුයි, ලාබයි, මම කැමතියි.
*F*. ඔයා එයාට කතා කරලා එන්න, ඒ අතරේ මම අවශ්‍ය දේවල් මිලට ගන්නම්.
*G*. සුබ උදෑසනක් විනෝ! ඔයා ආවේ තනියෙන් ද?
*H*. සුබ උදෑසනක් සර්!
*I*. නැහැ සර්, මම ආවේ අම්මාත් එක්ක. එයා වෙළෙඳපළේ බඩු ගන්නවා.
*J*. මම බඩු අරන් ඉවරයි විනෝ. ඔයා ඔයාගේ සර් එක්ක කතා කරන්න ඇතිනේ. දැන් අපි ගෙදර යමු ද?
*K*. හා හොඳයි. ඔයත් එයා එක්ක යන්න, සුබ දවසක්! ආයුබෝවන්.
*L*. ආයුබෝවන් සර්!

**48.** මව සහ ඇගේ පුතා අතර සංවාදය නිවැරදිව පෙළගස්වා ඇත්තේ පහත දැක්වෙන කවර වරණයෙහි ද?

(1) *D, C, A, E, F, B*
(2) *D, C, E, A, B, F*
(3) *D, E, A, B, C, F*
(4) *D, E, A, B, F, C*
(5) *D, E, A, C, B, F*

**49.** ගුරුවරයා සහ ශිෂ්‍යයා අතර සංවාදය නිවැරදිව පෙළගස්වා ඇත්තේ පහත දැක්වෙන කවර වරණයෙහි ද?

(1) *G, H, I, K, L*
(2) *G, H, I, L, K*
(3) *H, G, I, K, L*
(4) *H, G, I, L, K*
(5) *H, G, K, L, I*

**50.** සමස්ත සංවාදයෙහි තාර්කික අනුක්‍රමය දැක්වෙන්නේ පහත සඳහන් කවර වරණයෙහි ද?

(1) *D, E, A, C, B, L, F, G, H, I, K, J*
(2) *D, C, E, A, L, B, F, H, G, I, J, K*
(3) *D, E, A, B, C, L, F, H, G, I, J, K*
(4) *D, E, A, B, C, F, G, H, I, K, J, L*
(5) *D, C, E, A, B, F, H, G, I, J, K, L*

* * *